# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# තාවකාලික පදනම මත කණිෂ්ඨ සේවකයින් බඳවා ගැනීම

- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
- පත්වීම් තාවකාලික පදනම මත වන අතර පැමිණීම මත පදනම් වූ දෛනික දීමනාවක් ගෙවනු ලැබේ.
- වැඩ, හැසිරීම හා පැමිණීම මත සේවයේ නැවත පිහිටුවීම සඳහා සලකා බලනු ලැබේ.
- විශ්වවිද්‍යාලයීය ආකෘතියට අනුව පිළියෙල කළ අයදුම්පත් සහතික කල අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සහතික පිටපත් සහ උප්පැන්න සහතිකයේ හෝ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් සමඟ **ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2024.02.26**

## තෝරාගැනීමේ ක්‍රමවේදය

- ප්‍රායෝගික පරීක්ෂණ සහ / හෝ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අනුව.

## පොදු කොන්දේසි

01. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

02. අයදුම්කරුවන් තෝරා ගැනීම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදු කරනු ලැබේ.

03. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

04. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

05. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (**https://kdu.ac.lk**) භාගත කර ගත හැකි ආකෘති පත්‍රය මඟින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට දන්වා සිටින අතර ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්ඩීකේසී සන්දනායක
වැඩබලන ලේඛකාධිකාරී

# 01. තාවකාලික රසායනාගාර සහයක (රත්මලාන පරිශ්‍රය සඳහා)

## සුදුසුකම්

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම.

සහ

2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් හෝ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක් මගින් ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් නිකුත් කරන ලද සම්මත රසායනාගාර උපකරණ සහ රසායනාගාර ශිල්පීය ක්‍රම පිළිබඳව දැනුමක් ඇති ක්ෂේත්‍රයක **NVQ 2** හෝ **NVQ 3** මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

අදාළ ක්ෂේත්‍රයේ දැනුම සමඟ අවම වශයෙන් මාස 06ක සේවා පළපුරුද්ද සහ සම්මත රසායනාගාර උපකරණ භාවිතය, සැපයුම් සහ අවශ්‍ය පරිදි නව රසායනාගාර ශිල්පීය ක්‍රම ඉගෙනීමේ හැකියාව තිබිය යුතුය.

3. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

4. පරිගණක හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙහි දැනුම හා පළපුරුද්ද ඇති අයවලුන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

## වැටුප් හා අනෙකුත් දීමනා

- රු. **2,000/-**ක දෛනික වැටුපක් ද, සේවයට පැමිණීම මත රජයේ අනුමත අනෙකුත් දීමනාවන්හි දෛනික අනුපාතයක් ද ගෙවනු ලැබේ. ඒ අනුව රු. **2,593/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

- තවද වැඩ කරනු ලබන දින 20ක් සඳහා මසකට රු. **51,867/-** ක දළ වැටුපක් ද මීට අමතරව සේවා අවශ්‍යතාවය මත සති අන්තයේද රාජකාරීන් සඳහා පැමිණිය හැකි අතර අතිකාල දීමනාද ගෙවනු ලැබේ.

## අනෙකුත් වරප්‍රසාද

- සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.

## 02. තාවකාලික විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරු
## (රත්මලාන පරිශ්‍රය සඳහා)

<u>සුදුසුකම්</u>

1. 08 වන ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

2. අ. 1/32, පරිමාණ කියවීමට හැකි වීම, භාග මිනුම් සටහන් කර ගත හැකි වීම, තෙල් පෙරණ (**Oil Filter**) නඩත්තුව ඇතුළත්ව එන්ජින් සහ පොම්ප වල ක්‍රියාකාරීත්වය, එදිනෙදා වෙනස් කිරීම් සහ එදිනෙදා නඩත්තු කල හැකි වීම.

   ආ. ස්පර්ශක ආමාන (**Feeler Gauges**) ක්‍රියාකරවීම, ස්ථාවර තෙරපුම් උෂ්ණත්ව මානයන් කියවීමට සහ තේරුම් ගැනීමට හැකි විය යුතුය.

   ඇ. පොම්ප සහ එන්ජින් වල කොටස් අළුත්වැඩියා කටයුතු කිරීම මෙන්ම නිසි පරිදි ස්ථාපනය කළ හැකි වීම සහ අනෙක් සුළු අළුත්වැඩියා කටයුතු ඉටු කල හැකි විය යුතුය.

   ඈ. විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ ප්‍රවීණතාවයක් තිබිය යුතු අතර ප්‍රධාන විද්‍යුත් විභාජන (**Electrical Main Distribution**) සම්බන්ධ ගියර් පද්ධති හැසිරවීම සම්බන්ධයෙන් පළපුරුද්දක් තිබිය යුතුය.

3. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරුවෙකු වශයෙන් අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්ද.

4. වයස අවුරුදු 40 නොඉක්මවිය යුතුය.

<u>වැටුප් හා අනෙකුත් දීමනා</u>

- රු. **2,000/-**ක දෛනික වැටුපක් ද, සේවයට පැමිණීම මත රජයේ අනුමත අනෙකුත් දීමනාවන්හි දෛනික අනුපාතයක් ද ගෙවනු ලැබේ. ඒ අනුව රු. **2,593/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

- තවද වැඩ කරනු ලබන දින 20ක් සඳහා මසකට රු. **51,867/-** ක දළ වැටුපක් ද මීට අමතරව සේවා අවශ්‍යතාවය මත සති අන්තයේද රාජකාරීන් සඳහා පැමිණිය හැකි අතර අතිකාල දීමනාද ගෙවනු ලැබේ.

<u>අනෙකුත් වරප්‍රසාද</u>

- සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.

# 03. තාවකාලික පෙදරේරු
# (රත්මලාන පරිශ්‍රය සඳහා)

**සුදුසුකම්**

1. සිංහල / දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකි වීම.

2. අ. ගඩොල් ආශ්‍රිතව බැම් බැඳීම, අත්තිවාරම් දැමීම, බිත්ති බැඳීම, කුළුණු බැඳීම, දුම් කවුළු සැකසීම, කාණු පද්ධති සැකසීම ආදියට ඇති හැකියාව.

   ආ. කපරාරු කිරීම, කොන්ක්‍රීට් මිශ්‍රණ සැකසීම, කොන්ක්‍රීට් ඇතිරීම හා කොන්ක්‍රීට් ආශ්‍රිත සියළු ක්‍රියාකාරකම් වලට ඇති හැකියාව.

   ඇ. ගොඩනැගිලි ඉදිකිරීම් වලට අදාළ සැලසුම් කියවීමට හා සාමාන්‍ය ඉදිකිරීම් වලට අදාළ අත්තිවාරම් සැලසුම් කිරීමට ඇති හැකියාව.

   ඈ. වර්ණ ආලේප කිරීමට ඇති හැකියාව.

3. පෙදරේරුවෙකු වශයෙන් වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

4. වයස අවුරුදු 40 නොඉක්මවිය යුතුය.

**වැටුප් හා අනෙකුත් දීමනා**

- රු. **2,000/-**ක දෛනික වැටුපක් ද, සේවයට පැමිණීම මත රජයේ අනුමත අනෙකුත් දීමනාවන්හි දෛනික අනුපාතයක් ද ගෙවනු ලැබේ. ඒ අනුව රු. **2,593/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

- තවද වැඩ කරනු ලබන දින 20ක් සඳහා මසකට රු. **51,867/-** ක දළ වැටුපක් ද මීට අමතරව සේවා අවශ්‍යතාවය මත සති අන්තයේද රාජකාරීන් සඳහා පැමිණිය හැකි අතර අතිකාල දීමනාද ගෙවනු ලැබේ.

**අනෙකුත් වරප්‍රසාද**

- සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.

## 04. තාවකාලික කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු (රත්මලාන පරිශ්‍රය සඳහා)

**සුදුසුකම්**

1. 08 වන ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

2. අනුපිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර සහ අනෙකුත් කාර්යාල යන්ත්‍රවල සුළු අළුත්වැඩියා කිරීම් ඇතුළුව මෙහෙයුම් සහ නිසි නඩත්තුව පිළිබඳ අවම වශයෙන් වසර 5 ක පළපුරුද්ද.

3. වයස අවුරුදු 40 නොඉක්මවිය යුතුය.

**වැටුප් හා අනෙකුත් දීමනා**

- රු. **1,500/-**ක දෛනික වැටුපක් ද, සේවයට පැමිණීම මත රජයේ අනුමත අනෙකුත් දීමනාවන්හි දෛනික අනුපාතයක් ද ගෙවනු ලැබේ. ඒ අනුව රු. **2,093/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

- තවද වැඩ කරනු ලබන දින 20ක් සඳහා මසකට රු. **41,867/-** ක දළ වැටුපක් ද මීට අමතරව සේවා අවශ්‍යතාවය මත සති අන්තයේද රාජකාරීන් සඳහා පැමිණිය හැකි අතර අතිකාල දීමනාද ගෙවනු ලැබේ.

**අනෙකුත් වරප්‍රසාද**

- සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.